# ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

## ප්‍රධාන තොරතුරු ලේඛනය

## අරමුණ

මෙම ලේඛනය මගින් ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ආයතනයෙහි ගණුදෙනුකරුවන් වෙත අර්පණය කරනු ලබන ණයට දීම් සහ තැන්පතු පිළිබඳව ප්‍රධාන තොරතුරු ඔබ වෙත සපයනු ලබයි. සමාගම විසින් ඕනෑම අවස්ථාවකදී සඳහන් කරන ලද නියමයන්, කොන්දේසි සහ අදාල අයකිරීම් සහ ගාස්තු පිළිබඳව කරුණු සංශෝධනය කිරීමට , ඉවත් කිරීමට අයිතිය රඳවා තබා ගනී. මෙම තොරතුරු පහසුකම් ස්වභාවය අපේක්ෂිත ප්‍රතිලාභ සහ පිරිවැය පිළිබඳව අවබෝධ කර ගැනීම සඳහා ඔබට උදව් කිරීමට සහ වෙනත් පහසුකම් සමග එය සංසන්ධනය කර බැලීම සඳහා ඔබට උදව් කිරීමටද ශ්‍රී ලංකා මහ බැංකුවේ විධි විධාන පරිදි ඔබ වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## නිශ්පාදනයේ ප්‍රධාන ලක්ෂණයන්

| පහසුකම් / සේවාව | විස්තරය |
|---|---|
| කල්බදු | මූල්‍ය කල්බදු පහසුකම් වයස අවුරුදු 18ට වැඩි පුද්ගලයන් සඳහාද නෛතික ස්ථතීන් සඳහාද ප්‍රධාන වශයෙන්ම ඔවුන්ගේ වාහන සහ යන්ත්‍ර සහ උපකරණවල තෝරාගත් බාණ්ඩයන් සඳහා මූල්‍ය සැපයීමටද ලබා ගැනීමට සලස්වනු ලැබේ. |
| වාහන ණය | මෙහෙයුම් ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා හෝ පෞද්ගලික අවශ්‍යතාවයන් සඳහා ගණුදෙනුකරුවන්ට අයිති වාහනයක් ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී වෙත උඩපන කිරීම මගින් වාහන ණයක්ද අපේක්ෂිත ගණුදෙනුකරුවන්ට ලබාගත හැක. |
| කුලී සින්නක්කර | ආයතනය විසින් වයස අවුරුදු 18ට වැඩි පුද්ගලයන් වෙත සහ නෛතික ස්තතීන් වෙත වාහන, තෝරාගත් යන්ත්‍ර සහ උපකරණ බාණ්ඩයන් සඳහා මූල්‍ය සැපයීමට කුලී සින්නක්කර පහසුකම්ද අර්පණය කරනු ලබයි. |
| ස්ථාවර තැන්පතු | ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය වෙත ඔබගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ස්ථාවර තැන්පතු හඳුන්වා දෙනු ලබයි. තැන්පතු කාලපරිච්ඡේදය අවම වශයෙන් මාස 1 සිට මාස 60 දක්වා වන බාණ්ඩයන් අතර තිබේ. වයස අවුරුදු 18ට වැඩි පුද්ගලයෙකු සඳහා වන අවම තැන්පතුව රුපියල් 10,000/-ක් වන අතර ආයතනයක් සඳහා එය රුපියල් මිලියන 1ක් වන්නේය. |

## ණයට දීමේ පහසුකම් සඳහා පොළී අනුපාතය , ගාස්තු සහ අය කිරීම්

ණයට දීමේ පහසුකම්_ඔබ විසින් ලබා ගන්නා අවස්ථාවේදී ඔබ විසින් යම් ස්ථාවර ගෙවීම් සහ ගාස්තු දැරීමට සිදුවනු ඇත. සාමාන්‍ය ගාස්තු සහ ගෙවීම් වන්නේ ලේඛනමය ගාස්තු, අලෙවි කිරීම් විධායක ගාස්තුව, අදාල වන පරිදි දැනට පරිචයේ පවතින යම් කොමිස් මුදල් (වෙනස් වීමට යටත්ව ) වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු , මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි ගාස්තු සහ අදාල වන පරිදි වන රක්ෂණ වාරික මුදල් වේ. අදාල වන්නේ නම් ඔබ විසින් රජය වෙත බදු සහ අය කිරීම්ද ගෙවීමට සිදු වනු ඇත. ගාස්තු සහ අයකිරීම්වල වෙන් වෙන් වශයෙන් වන විස්තරය ගිවිසුමේ / අර්පණ ලිපියෙහි සඳහන් වේ. ඉහත සඳහන් කරන ලද ගාස්තු සහ අයකිරීම් ලැයිස්තුව ස්ථාවර නොවන අතර එය විටින් විට වෙනස් විය හැක. ඉහත ලැයිස්තු ගත කර ඇති ගාස්තු සහ අයකිරීම් පොදුවේ පිළිගනු ලබන වර්තමාන වෙළඳපොළ පරිචයන්ට ගැළපෙන පරිදි වේ.

කරුණාකර අන්තර්ජාලයෙහි දැක්වෙන පොළී අනුපාත, ගෙවීම් සහ ගාස්තු (Interest Rates, Fees) පත්‍රය බලන්න.

## පහසුකම් / සේවාව ලබා ගැනීමට අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය

ඔබගේ අවශ්‍යතාවයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ඔබට ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි ඕනෑම ශාඛාවකට පැමිණිය හැක. අලෙවි විධායකවරයෙක් ඔබ වෙත පත් කරනු ලබන අතර ඔහු විසින් සමස්ථ ක්‍රියාවලිය පුරාවටම ඔබට මග පෙන්වා ඔබට උදව් කරනු ඇත. අයදුම්පත්‍රයක් / මැන්ඩේට් පත්‍රයක් / ණය ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීමට ඔබගෙන් ඉල්ලා සිටිනු ඇති

අතර ඔබගේ පහසුකම / තැන්පතුව ඉදිරිපත් කිරීම අනුමත කිරීමට ඔබට හැකිවන පහත සඳහන් වන මූලික ලේඛන අවශ්‍ය වනු ඇත.

| | |
|---|---|
| කල්බදු ,<br>කුලී සින්නක්කර හෝ<br>වාහන ණය | • ඔබගේ කැමැත්ත පරිදි ජාතික හැඳුනුම්පත විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.<br>• ඉහත හඳුනාගැනීම් ලේඛනයෙහි දැක්වෙන ලිපිනය ඔබගේ ලිපිනයට වෙනස් නම් ඔබගේ නමින් තිබෙන විදුලි ,ජල හෝ ස්ථාවර දුරකතන සඳහා වූ මෑත කාලීන උපයෝජන බිල්පතක් / බිල්පත් (මාස 3කට වඩා පැරණි නොවන).<br>• සැපයුම්කරුගෙන් ඉන්වොයිස්පත්‍රය හෝ මිළ සඳහන<br>• අපට පිළිගත හැකි තක්සේරු නියෝජිත ආයතනයක් (තක්සේරුකරුවෙක් ) විසින් වූ මෑත කාලීන තක්සේරුවක් / තක්සේරු වාර්තාවක්<br>• මෑත කාලීනව වැටුප් විස්තර පත්‍රිකා සහ බැංකු ප්‍රකාශයන්.<br>• නෛතික ස්ථතීන් වන අවස්ථාවන්හිදී සංස්ථාපන සහතිකය , සාංගමික සංස්ථාපත්‍රය , අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය , ආකෘති පත්‍ර අංක 40 හෝ ආකෘති පත්‍ර අංක 1හි පිටපත, ආකෘති පත්‍ර අංක 20 සහ ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී විසින් ඉල්ලා සිටින වෙනත් අදාල ලේඛන.<br>• මෑත කාලීනව විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගැනීමට ඇත්නම් සමාගම් සඳහා වූ අභ්‍යන්ත/ කළමණාකරණ ගිණුම්.<br>• ගෙවීම් හැකියාව තහවුරු කිරීමට වෙනත් සෘජු ආදායම් හෝ වෙනත් ප්‍රභවයන්ට අදාල ලේඛන |
| ස්ථාවර තැන්පතු | • කැමති පරිදි ඔබගේ ජාතික හැඳුනුම්පත , විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.<br>• ඉහත හඳුනාගැනීම් ලේඛනයෙහි දැක්වෙන ලිපිනය ඔබගේ ලිපිනයට වෙනස් නම් ඔබගේ නමින් තිබෙන විදුලි ,ජල හෝ ස්ථාවර දුරකතන සඳහා වූ මෑත කාලීන උපයෝජන බිල්පතක් / බිල්පත් (මාස 3කට වඩා පැරණි නොවන).<br>• නෛතික ස්ථතීන් වන අවස්ථාවන්හිදී සංස්ථාපන සහතිකය , සාංගමික සංස්ථාපත්‍රය , අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය , ආකෘති පත්‍ර අංක 40 හෝ ආකෘති පත්‍ර අංක 1හි පිටපත, ආකෘති පත්‍ර අංක 20 සහ ඒ.එම්.ඩබ්ලිව්.සී.එල් සහ ණශක හි අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය වෙනත් අදාල ලේඛන<br>• මෑත කාලීනව විගණනය කළ මූල්‍ය ප්‍රකාශන හෝ ලබා ගැනීමට තිබේ නම් කළමණාකරන ගිණුම්<br>• අවශ්‍ය තැන්හිදී අරමුදල් ලැබීම් පෙන්වීමට අදාල ලේඛන |

## ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

පහසුකම් නිශ්පාදනයෙන් නිශ්පාදනයට ප්‍රධාන නියමයන් සහ කොන්දේසි වෙනස් වේ. නියමයන් සහ කොන්දේසි ඔබ වෙත සපයනු ලැබූ අර්පණ ලිපියෙහි සහ ගිවිසුම් ලිපියෙහි සඳහන් වේ.

## අදාල වන නෛතික විධි විධාන

මූල්‍ය කල්බදු 2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පනත මගින් පාලනය වේ. කුලී සින්නක්කර කාර්යයන්හිදී 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත අදාල වේ. වාහන ණය ඔබ සහ ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය අතර එකග වූ නියමයන් සහ කොන්දේසි මගින් පාලනය වනු ඇති අතර ඒවා ණය ගිවිසුමෙහි දැක්වේ. අවශ්‍යතාවයක් උද්ගත වුවහොත් ඕනෑම වෙනත් නෛතික විධි විධානයක් යටතේ නඩු පැවරීමටද ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය තම අයිතියද රඳවා තබා ගනී.

මූල්‍ය සමාගම්වල සියලු ණයට දීමේ සහ තැන්පතු පහසුකම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධි විධාන සහ මාර්ග උපදේශයන්ට යටත් වේ. 2006 අංක 6 දරණ මූල්‍ය ගණුදෙනු වාර්තා කිරීමේ පනත, 2012 ත්‍රස්තවාදය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මූල්‍ය සැපයීමේ එක්සත් ජාතීන්ගේ රෙගුලාසි අංක 1 සහ 2016 ජනවාරි මාසයේ අංක 1951 / 13 දරණ අති විශේෂ ගැසට්පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ මූල්‍ය බුද්ධිමය ඒකකය වෙත සැක කටයුතු ගණුදෙනු පිළිබඳව වාර්තා කිරීමටද ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය බැඳී සිටී. ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය විසින් ණය ගැණුම්කරුවනගේ සහ ඔවුන් වෙත ණයටදීම් සම්බන්ධයෙන් වන විස්තර ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යංශය වෙත වාර්තා

කිරීමටද අනිවාර්ය වන්නේය. ඉල්ලීම මත ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය විසින් නීතිය මගින් තොරතුරු ලබා ගැනීමට හිමිකම ඇති රජයේ ආයතනයන් වෙත සේවාදායකයින්ගේ තොරතුරු සපයනු ඇත.

## පැමිණිලි පාලනය කිරීමේ ක්‍රියා පටිපාටිය

ඒ.එම්.ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය විසින් සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් තම ප්‍රතිචාරයන් ලබාදීමට අපගේ සේවාදායකයන්ව දිරි ගන්වන්නෙමු. පහත සඳහන් ආකාරයන්ගෙන් ඕනෑම පැමිණිලි, ප්‍රතිචාර, ඇගයීම් පිළිබඳව වාර්තා කිරීමට ඔබට ඇරයුම් කරන්නෙමු. එනම්,

- ඔබ වෙත වෙන් කර ඇති අදාල අලෙවි විධායක සම්බන්ධ කර ගැනීම මගින්
- අදාල ශාඛා කළමණාකරු සම්බන්ධ කර ගැනීම මගින්
- අදාල ණයට දීම් නිශ්පාදන අදාල කරණා සම්බන්ධයෙන් දුරකතන අංක 0775058703 මගින් විද්‍යුත් තැපැල් - Sanjaya.Thenuwara@amwild.com මගින් සාමාන්‍යාධිකාරී අලෙවි තනතුර දරන සංජය තේනුවර මහතා සම්බන්ධ කර ගැනීම මගින්
- තැන්පතු නිශ්පාදනවලට අදාල කාරණා සම්බන්ධයෙන් දුරකතන අංක 0773105790 මගින් සහ විද්‍යුත් තැපැල් Uma.Maheswaran@amwltd.com වන තැන්පතු ප්‍රධානී උමා මහේෂ්වරන් මහතා සම්බන්ධ කර ගැනීම මගින්
- අපගේ වෙබ් අඩවිය වන www.capital leasing.lk/Contactus.aspx අප වෙත ලිවීම මගින්

ප්‍රතිචාර / පැමිණිලි ලිඛිතවම වීම අත්‍යවශ්‍ය නොවේ. පැමිණිල්ලක් ලැබුණු විට එය ලැබුණු බව අප පිළිගනු ලැබුණු ඇති අතර ගන්නා ලද ක්‍රියා මාර්ගය පිළිබඳ ඔබ වෙත දැනුම් දෙනු ඇත.

## කලින් අවසන් කිරීම / ආපසු ලබා ගැනීම් ගාස්තු

සම්පූර්ණ කාල පරිච්ඡේදයට ප්‍රථමයෙන් ඔබ විසින් ණය මුදලක් අවසන් කළ හැක. එලෙස කලින් අවසන් කිරීම් කර්මාන්තයේ පරිචයට අනුකූලව යමින් කලින් අවසන් කිරීමේ ගාස්තුවකට යටත් වන්නේය. කලින් අවසන් කිරීමේ ගාස්තු ඔබ විසින් ගෙවා ඇති වාරික සංඛ්‍යාව , හිඟ තබා ඇති වාරික (වෙතොත්) සහ කලින් හිලව් කරන අවස්ථාවේදී අයවීමට තිබෙන මුල් මුදල යන කරුණු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව සමාගම විසින් තීරණය කරනු ඇත.

ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් ගත් කළ කල් පිරීමට මත්තෙන් ආපසු ලබා ගැනීම් සඳහා පොළී අනුපාතය මත දඩ ගාස්තුවකට යටත් වනු ඇත. අඩුම තරමින් සමාගම වෙත එක් දිනක දැන්වීමක් ලබා දිය යුතු වන්නේය.